57

# ගාල්ල කොටුව ඕලන්ද රෙපරමාදු දේවස්ථානයේ ගෘහ නිර්මාණවල විශේෂ ලක්ෂණ

*එච්. චානක සුපුන් තරංග* [1]
HU/2012/2232

ලන්දේසීන් විසින් ගාල්ල ප්‍රදේශයේ පිහිටුවන ලද ගාල්ල කොටුව ඕලන්ද රෙපරමාදු දේවස්ථානය ලාංකේය කිතුණු බැතිමතුන්ගේ අවධානය මතු නොව විදේශීය කිතුණු බැතිමතුන්ගේ අවධානය ද දිනූ දේවස්ථානයකි. ආගමික දෘෂ්ටියෙන් විනිර්මුක්තව පුරාවිද්‍යාත්මක දෘෂ්ටියකින් දේවස්ථානය පිළිබඳ අවධානය යොමු කරන කල මෙය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් අනූන දේවස්ථානයක් බව සනාථ වේ. දේවස්ථානය නිර්මාණය කරන ලද ගෘහ නිර්මාණ ශිල්පක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ක්ෂේත්‍ර ගවේෂණ හා සාහිත්‍යමය මූලාශ්‍ර මෙම දේවස්ථානයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය වේ.

ප්‍රමුඛ පද ඃ ගාල්ල කොටුව ඕලන්ද රෙපරමාදු දේවස්ථානය, ගෘහ නිර්මාණ ශිල්පය, කිතුණු දහම

1 *ප්‍රාසංගික කලා ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර* tharangachana@gmail.com